# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2094/38 - 2018 ඔක්තෝබර් මස 26 වැනි සිකුරාදා - 2018.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් කාර්ය පරිපාටික රීති 40(1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි

බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය නම් වූ මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන ප්‍රඥප්ති කෙටුම්පත සඳහා බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය, අමාත්‍ය මණ්ඩල තීරණ අංක. VI/113/03-2018-02 (i) හා 2018.03.20 දිනැතිව ලැබී ඇති බවත් එය බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය සඳහා මවිසින් යෝජනා කරන්නට නියමිත බවත් මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,<br>
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන,<br>
විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා<br>
ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය.<br>
බස්නාහිර පළාත.

2018 ඔක්තෝබර් මස 10 වැනි දින.

**2018 අංක ............ දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය**

බස්නාහිර පළාත තුළ සංචාරක කටයුතු වල නියැලෙන්නන්ගේ වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම, ඔවුන්ට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා සහාය සේවාවන් සැපයීම, සංචාරක සේවාවල ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම, සංචාරක ආකර්ෂණ ස්ථානයන් ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා පළාතේ දේශීය හා විදේශීය සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා ද, බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩලය සංස්ථාපනය කිරීම සඳහා ද, 1994 අංක 03 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා හා ඊට අනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලසීමටද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2018 අංක ........... දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

1A - PG 4298 — 08 (2018/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### *I* කොටස

### බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය පිහිටුවීම

සංචාරක මණ්ඩලය පිහිටුවීම.

2. (1) මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය මෙයින් සංස්ථාපනය කරනු ලැබේ.

(2) මණ්ඩලය (1) උපවගන්තිය අනුව නියමිත නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති, නඩුපැවරීමට හා නඩු පවරනු ලැබිය හැකි සංස්ථාපිත ආයතනයක් වන්නේ ය.

### *II* කොටස

### මණ්ඩලයේ අරමුණු හා බලතල

මණ්ඩලයේ අරමුණු

3. මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

(1) පළාත තුළ විධිමත් හා අවිධිමත් සංචාරක සේවාවන්හි නියුතු වූවන්ගේ සහ සංචාරක ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු වන්නන්ගේ වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම හා මාර්ගෝපදේශයන් සහ සහය සේවා සැපයීම.

(2) පළාත තුළ විධිමත් හා අවිධිමත් සංචාරක සේවා සපයන ආයතනවල සේවා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම.

(3) පළාත තුළ හඳුනා ගනු ලබන සංචාරක ආකර්ෂණීය ස්ථානයන් ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(4) දේශීය විදේශීය සංචාරකයින්ගේ විවේකය හා විනෝදය සඳහා පළාත තුළ බහුවිධ සංචාරක අත්දැකීම් අත්විඳීමේ පහසුකම් වර්ධනය කිරීම.

(5) පළාත තුළ හඳුනා ගනු ලබන සංචාරක ආකර්ෂණීය ස්ථාන පිළිබඳ දේශීය හා විදේශීයව ප්‍රචාරණය

(6) පළාත තුළ සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් දිරි ගැන්වීම සහ උපදේශාත්මක සේවා සැපයීම.

(7) පළාතේ සංචාරක කටයුතු දේශීයව හා විදේශීයව ප්‍රචාරණය සඳහා අන්තර් පළාත් සහයෝගීතාවය වර්ධනය කිරීම.

මණ්ඩලයේ බලතල

4. මණ්ඩලයේ බලතල පහත පරිදි වේ.

(1) යම් චංචල හෝ නිශ්චල දේපලක් මිලදී ගැනීම, බද්දට ගැනීම හෝ අත්පත් කර ගැනීම දැරීම හා පවරන ලද සාධන පත්‍රයේ කොන්දේසි වලට යටත්ව විකිණීම, බදු දීම හෝ උකස් කිරීම.

(2) සංචාරක කටයුතු පුහුණු කිරීමට හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට සම්බන්ධ ක්‍රියාකාරකම් හා සම්බන්ධිත පරිශ්‍ර පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(3) මණ්ඩලයේ අරමුණු සපුරා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලබා දී ඇති ප්‍රමාණයට දේශීයව හෝ විදේශීයව ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීම.

(4) අරමුණු සපුරා ගැනීම සඳහා ඉවහල් වන පුහුණු කටයුතු පැවැත්වීම සහ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පුහුණු වූවන් නියාමනය කිරීම.

(5) සංචාරක සේවා සපයන ආයතන ලියාපදිංචිය හා නියාමනය සඳහා ක්‍රමෝපායයන් ස්ථාපිත කිරීම.

(6) මණ්ඩලය විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු හෝ කුලී නියම කිරීම හා අය කිරීම.

(7) මණ්ඩලයේ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන කාර්ය පටිපාටි නියම කිරීම.

(8) මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන පරිත්‍යාග භාර ගැනීම හා දැරීම.

(9) සංචාරක ගමන් සංවිධානය හා ඊට අදාළ නියෝජිත ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම සහ එම කටයුතු වල නිරත වීම.

(10) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් අරමුණු යටතට ගැනිය හැකි කවර හෝ කරුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු බලතල

## *III* කොටස

### අධ්‍යක්ෂක මණ්ඩලය

5. මණ්ඩලයේ සියලු පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් වන්නේය. අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය. මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය

(1) නිල බලයෙන් පත්වන සාමාජිකයන් ;

(අ) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු ; නිල බලයෙන් පත්වන සාමාජිකයින්
(ආ) පළාත් පාලන කොමසාරිස් ;
(ඇ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ;
(ඈ) සංචාරක විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක් ; සහ

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයන් තිදෙනෙක්. ඉන් අවම වශයෙන් එක් අයෙකුවත් සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ මනා පළපුරුද්දක් හා දැනුමක් සහිත කෙනෙක් විය යුතු අතර ඉන් එක් අයෙකු මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කළ යුතු ය. පත්කළ සාමාජිකයින්

(3) ඉහත (1) හා (2) උපවගන්ති වල සඳහන් පත් කිරීම් සම්බන්ධයෙන් වන පත්වීම් ලිපි අමාත්‍යවරයා විසින් නිකුත් කළ යුත්තේ ය.

6. යම් තැනැත්තෙකු,

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ, සාමාජිකයෙකු වීමට නුසුදුසුකම්
(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන්නේ නම් හෝ,
(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තෙක් බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් හෝ,
(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දන්ඩන නියමයකට යටත්ව සිටිනම් හෝ සිටියේ නම් හෝ,
(ඉ) අධිකරණයක් විසින් වස්තුභංගත්වයට පත් වී ඇති බව ප්‍රකාශ කර ඇත්තේ නම්

එවැනි තැනැත්තෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එවැන්නකු ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුස්සෙකු වන්නේ ය.

7. (1) මණ්ඩලයේ පත් කළ සෑම සාමාජිකයකුම, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට ගණින් ගැනෙන හා ඔහු පත් කරනු ලබන අවස්ථාවේ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, ධූරය දැරිය යුතුය. තවද, 9 (1) උප වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට නුසුදුස්සකු නොවිය යුතුය. පත්කළ සාමාජිකයන්ගේ ධූර කාලය.

(2) පත්කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරන ලබන අවස්ථාවකදී හෝ ඉල්ලා අස්වන අවස්ථාවකදී නැවත පත් කරන සාමාජිකයා විසින් ඉතිරිව ඇති ධූර කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

8. (1) 9(1) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව වන්නේය. මණ්ඩලයේ සභාපතිවරයාගේ ධූර කාලය.

(2) රෝගාතුරවීමකින් හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ තම ධුර කාලය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු පත් කළ හැකිය.

(3) අමාත්‍යවරයා විසින් සභාපතිවරයාගේ ක්‍රියා කලාපය පිළිබඳ සෑහිමකට පත් නොවන විට සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකිය.

(4) මණ්ඩලයේ සියළු රැස්වීම්වලදී සභාපතිවරයා මූලාසනය දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකදී සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතරින් එක් සාමාජිකයෙකු රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගත යුතුය.

සාමාජිකත්වයෙන් ඉවත් කිරීම.

9. (1) අමාත්‍යවරයා විසින් කවර හෝ පත් කළ සාමාජිකයකුගේ ක්‍රියා කලාපය පිළිබඳ සෑහිමකට පත් නොවන විට පත් කළ සාමාජිකයකුගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකිය.

(2) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත යවන ලද ලිපියක් අමාත්‍යවරයා පිළිගත් බව දැනුම් දීමෙන් අනතුරුව මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට, සාමාජිකයකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධුරයෙන් ඕනෑම අවස්ථාවකදී ඉල්ලා අස්විය හැකිය.

10. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක ගණ පූරණය සඳහා සාමාජිකයන් තිදෙනෙකු සිටිය යුතුය.

මණ්ඩලයේ කාර්ය පරිපාටිය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයන් පත්කිරීම දෝෂ සහිත වීම යන හේතු නිසා මණ්ඩලයේ යම් කිසි ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් බල රහිත නොවිය යුතුය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් අවම වශයෙන් මසකට වරක් හෝ පැවැත්විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධ කාර්යය පටිපාටි මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරන ආකාරයට විය යුතුය.

(4) අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවෙකුට පළාත් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා විධිවිධානවලට අනුකූලව පාරිශ්‍රමික, දීමනා හා වෙනත් වියදම් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(5) මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා අවශ්‍ය ස්වකීය බලතල සහ කාර්ය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපතිවරයාට, සාමාන්‍යාධිකාරිවරයාට හෝ මණ්ඩලයේ සේවා නියුක්තිකයෙකුට පවරා දිය හැකිය.

(6) යම් කරුණක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඡන්දය සම ලෙස බෙදීමක් ඇති වුවහොත් එම රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් හිමිවිය යුතු ය.

(7) මණ්ඩලයේ සේවා නියුක්තිකයන් අතරින් සුදුසු නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් පත් කළ හැකිය.

මණ්ඩලයේ මුද්‍රාව

11. (1) මණ්ඩලය සතු මුද්‍රාව අධ්‍යක්ෂවරයා භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන ආකාරයකට විය යුතු ය.

(3) සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට, ලියවිල්ලකට හෝ ගිවිස්නාවකට මණ්ඩලයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට, ලේඛනයට හෝ ගිවිස්නාවකට තම අත්සන තැබිය යුතු ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබන ලේඛන හා ලියකියවිලි පිළිබඳව ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

12. මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් මණ්ඩලයට ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතු ය. මණ්ඩලය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල

## IV වන කොටස

### මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී හා වෙනත් කාර්ය මණ්ඩලය

13. (1) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මෙහි මින්මතු සාමාන්‍යාධිකාරවරයා වශයෙන් හඳුන්වන, ඊට අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගනු ලබන පූර්ණකාලීන තැනැත්තෙකු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කළ යුතු ය. මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා

එසේ වුවද විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බලාත්මක වී නොමැති තාක් සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් සුදුසු අයෙකු ප්‍රධාන ලේකම්ගේ එකඟතාවය මත විෂයභාර අමාත්‍යංශයේ ලේකම් විසින් පත් කළ යුතු ය.

(2) මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය කිරීම මණ්ඩලයේ බලතල කටයුතු හා කාර්යයන් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ මණ්ඩලයේ සේවා නියුක්තිකයන්ගේ පරිපාලනය, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය විධිවිධානයට සහ පාලනයට යටත්ව සාමාන්‍යාධිකාරිවරයා වෙත පැවරේ.

(3) ස්වකීය කර්තව්‍යය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍යයයි මණ්ඩලය සලකනු ලබන සෙසු නිලධරයන් සහ සේවකයන් අනුමත බඳවා ගැනීම් පරිපාටියට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීමෙන් අනතුරුව සභාපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකිය. මණ්ඩලයේ සෙසු කාර්ය මණ්ඩලය

(4) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්ත යම් නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධාරියාගේ සහ එම නිලධාරියාගේ සේවා නියුක්ත පළාත් විෂයභාර අමාත්‍යාංශ ලේකම්ගේ කැමැත්ත ඇතිව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය.

## V කොටස

### මණ්ඩලයේ අරමුදල

14. මණ්ඩලය නමින් අරමුදලක් තිබිය යුතු ය. එම අරමුදලට, මණ්ඩලයේ අරමුදල

(අ) ප්‍රධාන වශයෙන් පළාත් සභාව විසින් මණ්ඩලයට විසර්ජනය කරන ලද මුදල්,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නියමකොට එකතු කරන ලද සියළු මුදල්,

(ඇ) ගාස්තු හා අය කිරීම් වශයෙන් මණ්ඩලය විසින් භාර ගන්නා ලද සියළු මුදල්,

(ඈ) ශ්‍රී ලංකාවෙන් හෝ ඉන් පිටත හෝ කවර හෝ ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන හෝ වෙනත් ආකාරයකින් ලැබෙන සියළු මුදල්,

(ඉ) මණ්ඩලය සතු දේපළ, වත්කම්, භාණ්ඩ හා උපකරණ විකිණීමෙන්, කුලියට දීමෙන්, බදු දීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන සියළු මුදල්,

(ඊ) යම් විශේෂ ව්‍යාපෘති ඉටු කිරීම හෝ යම් කාර්යයන් ඉටු කිරීම සඳහා හෝ පළාත් සභා අරමුදලින් හෝ පළාත් පාලන ආයතන වලින් හෝ වෙනත් යම් ආයතනයකින් ලැබෙන මුදල්,

(උ) මණ්ඩලය සතු මුදල් ආයෝජනය කිරීමෙන් හෝ තැන්පත් කිරීමෙන්, ලාභය, වාරික හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල්,

(ඌ) වෙනත් කවර හෝ නීත්‍යානුකුල ප්‍රභවයකින් ආයතනයට ලැබෙන මුදල්, බැරවිය යුතු ය.

අරමුදලින් ගෙවීම

15. අරමුදලින් පහත කරුණු සඳහා ගෙවීම් කළ හැකිය.

(1) මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට ගෙවිය යුතු පාරිශ්‍රමික,

(2) මණ්ඩලයේ නිලධාරීන්ට, සේවකයින්ට සහ සේවා නියුක්තිකයින්ට ගෙවිය යුතු වැටුප් හා වෙනත් දීමනා

(3) මණ්ඩලයට සේවා සපයන්නන්ට ගෙවිය යුතු ගෙවීම් හා පාරිශ්‍රමික,

(4) මණ්ඩලය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා හා ඉටු කිරීම සම්බන්ධයෙන් දරන ලද සියළු වියදම්

මුදල් වර්ෂය

16. මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

මණ්ඩලයේ ගිණුම්

17. මණ්ඩලයේ ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද ගිණුම් හා පොත් පත් පවත්වා ගෙන යා යුතු ය. මණ්ඩලයේ ගිණුම් පවත්වා ගෙන යාම මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යුත්තේ ය.

18. මණ්ඩලයේ අරමුදලේ මුදල් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව අදාළ වන්නේ ය.

## *VI* කොටස

### පොදු කරුණු

රීති

19. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් හා ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අය කිරීමට අදාළ සියළුම කරුණු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ පැවරෙන බලතලවලට හානියක් නොමැතිව රීති සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) මෙම වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින හෝ ඒ රීතියේ සඳහන් යම් දිනක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක්ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය. එසේ පළාත් සභාව විසින් අනුමත නොකරන ලද යම් රීතියක් එසේ අනුමත නොකිරීමට ගත් තීරණයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද යම් කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

## *VII* වන කොටස

### අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන

20. (1) මෙම ප්‍රඥප්තියට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1994 අංක 03 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) එසේ වුවද 1994 අංක 03 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය සතුව තිබූ :-

(අ) සියලු චංචල හා නිශ්චල දේපළ සහ

(ආ) සියලු වත්කම් හා බැරකම්

(ඇ) සියලු වගකීම් හා බැඳීම්

මෙම ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය සතු චංචල හා නිශ්චල දේපල, වත්කම් හා බැරකම් හා වගකීම් හා බැඳීම් වශයෙන් සැලකිය යුතු ය.

(3) 1994 අංක 03 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් ලෙස සැලකිය යුතු ය.

(4) 1994 අංක 03 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට එරෙහිව පවරන ලද සෑම නඩුවක්ම මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලැබූවක් සේ සැලකිය යුතු ය.

(5) තවද 1994 අංක 03 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩලයේ නිලධරයන් හෝ සේවකයන් මෙම මණ්ඩලයේ නිලධරයන් හෝ සේවකයන් වශයෙන් සැලකිය යුතු ය.

මණ්ඩලයේ නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ නිලධාරීන් වශයෙන් සැලකිය යුතු බව

21. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ නිරූපණය සහ කාර්යයන් උදෙසා මණ්ඩලයේ සියලුම සාමාජිකයන් නිලධාරීන් සහ සේවකයින් රාජ්‍ය සේවකයින් වශයෙන් සලකනු ලැබිය යුතු අතර අල්ලස් පනතේ කාර්යයන් සඳහා අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු ය.

අර්ථ නිරූපණය

22. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස

''පළාත'' යන්නෙන් බස්නාහිර පළාත ද,

''පළාත් සභාව'' යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ද,

''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලයේ සංචාරක විෂයභාර අමාත්‍යවරයා ද,

''ප්‍රධාන ලේකම්'' යන්නෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්වරයා ද, අදහස් වන්නේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

23. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

11 - 454

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.